UNITED NATIONS
SRI LANKA

# මාධ්‍ය නිවේදනය

## මිලියන 1.7 ක ජනතාවකට ජීවිතාරක්ෂක ආධාර සැපයීම සඳහා එක්සත් ජාතීන් ඇමරිකානු ඩොලර් මිලියන 47.2 ක් ඉල්ලා සිටියි

**2022, ජුනි 9, කොළඹ :** ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන් සහ රාජ්‍ය නොවන සංවිධාන ඒකාබද්ධ මානුෂීය අවශ්‍යතා සහ ප්‍රමුඛතා (HNP) සැලැස්මක් අද දියත් කරනු ලැබින.  ජුනි සිට සැප්තැම්බර් දක්වා මාස හතරක් තුළ ආර්ථික අර්බුදයෙන් දරුණු ලෙස පීඩාවට පත් වූ මිලියන 1.7 ක ජනතාවකට ජීවිතාරක්ෂක ආධාර සැපයීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 47.2 ක් ඉල්ලා සිටියි. මෑත කාලීන අර්බුදයෙන් පැන නගින හදිසි අවශ්‍යතා සඳහා ප්‍රතිචාර දැක්වීම සඳහා එක්සත් ජාතීන්ගේ අනුග්‍රහය සහිත බහු අංශ ජාත්‍යන්තර සහය සඳහා ශ්‍රී ලංකා රජය විසින් කරන ඉල්ලීමට මෙය සෘජුවම ප්‍රතිචාර දක්වන්නේ විශේෂයෙන්ම සෞඛ්‍ය ආරක්ෂණය සහ අත්‍යාවශ්‍ය ඖෂධ, ආහාර සහ කෘෂිකර්මාන්තය - ඉලක්කගත පෝෂණ සේවා ඇතුළුව - සුරක්ෂිත පානීය ජලය, හදිසි ජීවනෝපායන් සහ ආරක්ෂාව යටතේය.

ශ්‍රී ලංකාවේ මානුෂීය හවුල්කරු සංවිධානයන් ඇස්තමේන්තු කර ඇත්තේ මිලියන 5.7 කට ආසන්න කාන්තාවන්, ළමුන් සහ පුරුෂයන් දැනට මානුෂීය ආධාර අවශ්‍යව සිටින බවයි. HNP යටතේ ඉලක්ක කර ඇති මිලියන 1.7 ක ජනතාව ක්ෂණික සහාය අවශ්‍ය වන ජීවනෝපාය, ආහාර සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය අතින් වඩාත් අවදානමට ලක්ව ඇති පුද්ගලයන්ය.

"ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාවයට විවිධ සාධක බලපායි; අපි දැන් පියවර නොගතහොත් බොහෝ පවුල්වලට ඔවුන්ගේ මූලික ආහාර අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකි වනු ඇත. කලක් ශක්තිමත්ව පැවති ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවා පද්ධතිය දැන් අනතුරේ වැටී ඇත, ජීවනෝපායන් පීඩාවට පත්ව ඇති අතර වඩාත්ම අවදානමට ලක්විය හැකි අය විශාලතම බලපෑමට මුහුණ දී සිටිති." එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකාවේ නේවාසික සම්බන්ධීකාරක හනා සිංගර්-හම්ඩි මහත්මිය පැවසුවේ සංවර්ධනය සහ සමාජ-ආර්ථික මැදිහත්වීම් සඳහා වන ප්‍රයත්නයන් මධ්‍යයේ වසර අගදී මානුෂීය අර්බුදයක් ඇතිවීම වැළැක්වීමේ හදිසි අවශ්‍යතාවය අවධාරණය කරමිනි.

"දැන් ජාත්‍යන්තර ප්‍රජාව ශ්‍රී ලංකාවේ ජනතාව හා සහයෝගීතාවය ප්‍රකාශ කළ යුතු කාලයයි. එක්සත් ජාතීන් සහ මානුෂීය හවුල්කරුවන් විසින් පරිත්‍යාගශීලීන්, පෞද්ගලික අංශය සහ පුද්ගලයින්ගෙන් ඉල්ලා සිටින්නේ අර්බුදයෙන් වඩාත් පීඩාවට පත් වූ කාන්තාවන්, පුරුෂයන් සහ ළමයින්ට ජීවිතාරක්ෂක ආධාර සැපයීමට සහ එමඟින් රටේ මානුෂීය අවශ්‍යතා පිරිහීම වැළැක්වීම සඳහා මෙම සැලැස්මට කඩිනමින් සහාය දෙන ලෙසයි. ," ඇය වැඩිදුරටත් පැවසුවාය

මීට ප්‍රථම ඉහළ මධ්‍යම ආදායම් ලබන රටක් වූ ශ්‍රී ලංකාව නිදහසින් පසු එහි දරුණුතම ආර්ථික අර්බුදයට මුහුණ දී සිටියි. මැයි මස ආහාර උද්ධමනය 57.4% පැවති අතර ප්‍රධාන ආහාර ද්‍රව්‍යවල මෙන්ම ආහාර සැකසීම්, ප්‍රවාහනය සහ කර්මාන්ත සඳහා ඉන්ධන හිඟය පුළුල්ව පැතිර පවතිනේ දිනපතා සිදුවන විදුලි කප්පාදු සමඟිනි. නිෂ්පාදනය සඳහා මූලික යෙදවුම් නොමැතිකම, මුදල් ඒකකයේ සියයට 80 ක් අවප්‍රමාණය වීම (2022 මාර්තු සිට), විදේශ සංචිත හිඟය සහ රට ජාත්‍යන්තර ණය බැඳීම් සපුරාලීමට අසමත් වීම හේතුවෙන් ආර්ථිකය තියුනු ලෙස හැකිලීමකට ලක්ව ඇත.

ආර්ථික අර්බුදය විශේෂයෙන්ම ආහාර සුරක්ෂිතතාව, කෘෂිකර්මාන්තය, ජීවනෝපාය සහ සෞඛ්‍ය සඳහා ප්‍රවේශය කෙරෙහි බලපා ඇත.  පසුගිය අස්වනු කන්නයේ ආහාර නිෂ්පාදනය මින් පෙර වසරට වඩා සියයට 40 - 50 කින් අඩු වූ අතර බීජ, පොහොර, ඉන්ධන සහ ණය හිඟය සමඟ වත්මන් කෘෂිකාර්මික සමය අවදානම් තත්ත්වයක පවතී.

ඇස්තමේන්තුගත පුද්ගලයන් මිලියන 4.9 කට (ජනගහනයෙන් සියයට 22) දැනට ආහාර ආධාර අවශ්‍ය වේ. නවතම සමීක්ෂණවලින් හෙළි වන්නේ පවුල්වලින් සියයට 86 ක් ආහාර ගැනීම අඩු කිරීම, ආහාර ගැනීම මඟ හැරීම ඇතුළු අවම වශයෙන් එක් ක්‍රමයක් හෝ භාවිතා කරන බවයි.

මැයි මස අවසන් වන විට අත්‍යවශ්‍ය ඖෂධ 200ක් ජාතික මට්ටමින් තොග අවසන් වන අතර ඉදිරි මාස 2-3 තුළ තවත් ඖෂධ වර්ග 163 ක තොග නිමා වනු ඇත. මීට අමතරව, අත්‍යවශ්‍ය ශල්‍යකර්ම උපාංග 2,724 ක් සහ සාමාන්‍ය රසායනාගාර ද්‍රව්‍ය 250 ක් තොග අතර නැත. විදුලිය විසන්ධි වීම සහ ජනන යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමට ඉන්ධන නොමැතිකම හේතුවෙන් බොහෝ රෝහල්වලට සාමාන්‍ය සැත්කම් කල් දැමීම හැර වෙනත් විකල්පයක් නැත.

**** අවසන්****

*The United Nations in partnership with the government and people of Sri Lanka is pursuing a Sustainable Development Agenda that leaves no one behind. Collectively and through its specialised agencies, funds, programmes and offices, the UN strives to support the Government of Sri Lanka to achieve sustainable and inclusive economic growth, with equitable access to quality social services, strengthened human capabilities, human rights and social cohesion.*

*එක්සත් ජාතීන් රජය සහ ශ්‍රී ලංකාවේ ජනතාව සමඟ හවුල්කාරත්වයෙන් තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය අනුව කිසිවෙකු අත නොහරියි. සාමූහිකව සහ එහි විශේෂිත ආයතන, අරමුදල්, වැඩසටහන් සහ කාර්යාල හරහා එක්සත් ජාතීන් ශ්‍රී ලංකා රජයට ගුණාත්මක සමාජ සේවාවන්ට සමාන ප්‍රවේශයක්, මානව හැකියාවන් ශක්තිමත් කිරීම, මානව හිමිකම් සහ සමාජ සහජීවනය සමඟ තිරසර හා අන්තර්කරණීය ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමට සහාය වීමට උත්සාහ කරයි.*

*Learn more at https://srilanka.un.org/*

**Media Contacts:**
Dianne Silva, Communications Specialist, Office of the Resident Coordinator | dianne.silva@un.org | +94715306401
Mahina Bongso, Communications Analyst, FAO | mahina.hussain@fao.org | +94 769063511
Bismarck Swangin, Chief of Communication, Advocacy and Partnerships, UNICEF | bswangin@unicef.org | +94 777 236 548
Tanya Jansz | Communications Officer, WFP | tanya.jansz@wfp.org | +94769102462
Dilshani Dias, Communications & Advocacy Officer, UNFPA | didias@unfpa.org | +94 770152424

In Bangkok:
Pierre Peron, Regional Public Information Officer, UN Office for the Coordination of Humanitarian Affairs | peronp@un.org | +66 614 200 390
David Swanson, UN Regional Public Communications Officer, Department of Global Communications | swanson@un.org | +66 6 5982 5682

**Get in touch**: UN Sri Lanka on Twitter | Facebook | Instagram